# සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
## கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
## Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | SP/CEC/1/O/5 | | ඔබේ අංකය<br>உனது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2021.04. 07 |

චක්‍රලේඛ අංක 02/2021

සියළුම සමූපකාරවල සභාපතිවරුන් වෙත,

<u>දකුණු පළාතේ සමූපකාර සමිති සේවකයන් සඳහා ප්‍රසූත නිවාඩු</u>

දකුණු පළාත තුළ ලියාපදිංචි සමූපකාර සමිතිවල සේවිකාවන් සඳහා ප්‍රසූත නිවාඩු ලබාදීමේ ක්‍රමවේදය විධිමත් කිරීම සඳහා මෙම චක්‍රලේඛය 2021.01.01 දින සිට ක්‍රියාත්මක කරනු ලැබේ. සමූපකාර සේවකයන් සඳහා ප්‍රසූත නිවාඩු ලබාදීම සම්බන්ධව මෙම කොමිෂන් සභාව මෙතෙක් නිකුත් කරන ලද සියළු චක්‍රලේඛ මෙම චක්‍රලේඛ ක්‍රියාත්මක වීමත් සමඟම අවලංගු වේ.

01. සමූපකාර සේවයේ යෙදී සිටින සේවිකාවන්ට සෑම සජීවී දරු උපතක් සඳහාම වැඩ කරන දින 84 ක සම්පූර්ණ වැටුප් සහිත ප්‍රසූත නිවාඩු හිමිවිය යුතුය. නීති ප්‍රකාර විවාහයකට ඇතුලත් නොවී සත්‍ය වශයෙන්ම නිලධාරිණියට පාලනය කළ නොහැකි හේතූන් මත ලැබෙන දරුවකු සම්බන්ධයෙන් මෙම ප්‍රසූත නිවාඩු ලබා ගැනීමට පහත කරුණු සනාථ කළ යුතුය.

I. සිද්ධිය සිදුවූ ස්ථානය අයත් වන පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කර තිබිය යුතුය.

II. අදාල බල ප්‍රදේශය තුළ පිහිටි ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කර තිබිය යුතුය.

02. මෙම වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ගණන් බැලීමේදී එම නිවාඩු කාලය තුළට වැටෙන වෙළඳ නිවාඩු, සති අන්ත නිවාඩු, හා එම සති අන්ත නිවාඩු වෙනුවට ආදේශ කරන නිවාඩු දිනයන් ඇතුලත් නොකල යුතුය.

03. ඉහත සඳහන් අන්දමට ප්‍රසූත නිවාඩු හිමිවීමට නම් අදාල නිවාඩු ඉල්ලීම ,දරු ප්‍රසූතියෙන් සතියක් ඇතුලත ප්‍රසූතිය සිදුවූ දිනය ඇතුලත් පිළිගත හැකි ලිපිලේඛන සහිතව සමිතියට ඉදිරිපත් කල යුතුය. ප්‍රසූතිය සිදු වන දිනට ඇයට සිටින දරුවන් ගණන ද සමිතියට දැනුම් දිය යුතුය.

04. ප්‍රසූතියෙන් සජීවී දරු උපතක් සිදු නොවුවහොත් හෝ කළල රූපයක් බිහි කළහොත් හෝ ප්‍රසූතියෙන් සති හයක් ඇතුලත දරුවා මිය ගියහොත්, පිළිගත හැකි වෛද්‍ය වාර්තාවක් මගින් අදාල කරුණ සනාථ කරන්නේ නම් නිලධාරිණියට වැඩ කරන දින හතලිස් දෙකක් (42) ක් නිවාඩු වශයෙන් හිමිවේ.

2021.04.07


ලේකම් / செயலாளர் / Secretary } 091-2232794
පරිපාලන නිලධාරි / நிர்வாக அதிகாரி / Administrative Officer } 091-2234279
කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax } 091-2234383
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site } www.cec.sp.gov.lk
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail } empcommicoopsp@sltnet.lk

05. ගර්භනී අවස්ථාවේ පසුවන සමූපකාර සේවිකාවන්ට ගර්භනී අවස්ථාවේ පළමු මාස පහ (05) සම්පූර්ණ වූ පසු ප්‍රසූති නිවාඩු ලබාගන්නා තෙක් සේවා ස්ථානයටපැමිණිය යුතු වේලාවට වඩා පැය භාගයක් ප්‍රමාද වී පැමිණීමටත්, සේවා ස්ථානයෙන් පිටවිය යුතු වේලාවට වඩා පැය භාගයක් කලින් පිටවීමටත් අවස්ථාව ලබාදිය යුතුය.අදාල කාලසීමාව ගර්භනී සටහන මගින් සනාථ කරගත යුතුය.

06. ප්‍රසූත නිවාඩු ලබාගන්නා නිලධාරිණියක් ඇයට හිමි සම්පූර්ණ වැටුප් සහිත දින අසූ හතරක් (84) ක නිවාඩු කාලය අවසන්ව නැවත සේවයට වාර්තා කරන්නේ නම්, දරුවාට මාස පහක්(05)ක් සම්පූර්ණ වන දිනය දක්වා, දරුවාට මව්කිරි දීම වෙනුවෙන් සේවා ස්ථානයෙන් පිටවිය යුතු වේලාවට පැයකට කලින් පිටවී යාමට අවස්ථාව ලබාදිය යුතුය.

07. දරු ප්‍රසූතියක් අපේක්ෂා කරන නිලධාරිණියක ප්‍රසූතියට පූර්ව මාස තුන ඇතුලත මෙන්ම ප්‍රසූතියට පසු මාස තුනක සේවා කාලය තුළ මවට හෝ දරුවාට අනතුරුදායක විය හැකි රාජකාරීන්හි නොයෙදවීමට සමිතිය කටයුතු කල යුතුය. ප්‍රසූත නිවාඩු ලබා සිටින සේවිකාවක් ප්‍රසූතියෙන් දින 14ක් ගත වනතෙක් කුමන හෝ හේතුවක් මත කිසිඳු රාජකාරියක් සඳහා කැඳවීම නොකල යුතුය.

08. ප්‍රසූත නිවාඩු ලබා සිටින සේවිකාවක් සේවයට නොකැඳවා වැඩ තහනම් කිරීමකට හෝ සේවයෙන් පහ කිරීමකට හෝ භාජනය නොකළ යුතුය.

09. ඉහත 01 වගන්තියෙහි සඳහන් පරිදි වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබාගැනීමෙන් අනතුරුව, අදාල සේවිකාව ඉල්ලීමක් කරන්නේ නම් දරුවා රැකබලා ගැනීම වෙනුවෙන් දින අසූ හතර(84) ක අඩ වැටුප් සහිත නිවාඩු ලබාදිය යුතුය. දරුවා රැක බලා ගැනීම පිණිස තවදුරටත් නිවාඩු ඉල්ලා සිටින්නේ නම් වැටුප් රහිතව තවත් දින අසූ හතර(84) ක නිවාඩුවක් ලබාදිය හැකිය.

10. ඉහත 09 වගන්තියෙහි සඳහන් නිවාඩු ලබාගැනීමට නම් නිවාඩු ආරම්භ වන දිනට දින දහ හතරකට(14)කට පෙර සමිතිය වෙත ලිඛිත ඉල්ලීමක් කල යුතුය. මෙම අඩ වැටුප් සහිත හා වැටුප් රහිත නිවාඩු කාලය ගණන් බැලීමේදී අදාල කාල සීමාව තුලට වැටෙන වෙළඳ නිවාඩු, සති අන්ත නිවාඩු ප්‍රසූති නිවාඩු කාලයට ඇතුලත් වන සේ ගණනය කළ යුතුය.

මෙම චක්‍රලේඛය කොමිෂන් සභාවේ අනුමැතිය මත නිකුත් කරන ලදී.

ජයන්ත ජී.ලියනගේ.
ලේකම්.
සමූපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත.

පිටපත්
1. ලේකම්, කෘෂිකර්ම,ගොවිජන සංවර්ධන …….. සමූපකාර අමාත්‍යාංශය - දැ.ගැ.ස.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්, දකුණු පළාත - දැ.ගැ.ස.
3. දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුවට